# <u>පුවත්පත් නිවේදනය</u>

## <u>නැගෙනහිර විශ්වවිද්‍යාලයීය ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට ඉන්දියාවේ සහාය</u>

මඩකලපුව දිස්ත්‍රික්කයේ නැගෙනහිර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයට නවීන යටිතල පහසුකම් සැපයීම සඳහා ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අවබෝධතා ගිවිසුමකට 2019 ජනවාරි 21 වන දින අත්සන් තබන ලදී.

ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා හා නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශ ලේකම් එම්. එම්. පී. කේ. මායාදුන්න මැතිතුමා විසින් මෙම ගිවිසුමට අත්සන් තබන ලදී. මෙම අවස්ථාවට නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු රවුෆ් හකීම් මැතිතුමා හා ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද සහභාගී විය.

මෙම ව්‍යාපෘතිය හරහා ශ්‍රී ලංකා රුපියල් ඩොලර් මිලියන 275 ක මුල්‍ය ප්‍රදානයක් යටතේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනයේ ශ්‍රවණාගාරය නවීකරණය කිරීම, ඕඩියෝ හා වීඩියෝ පටිගත කිරීමේ හා සංස්කරණය කිරීමේ පහසුකම් සහිත නවීන ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම හා ආයතනය සඳහා වාහන ලබාදීම සිදු කෙරෙනු ඇත.

ජනතා කේන්ද්‍රීය සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා ශ්‍රී ලංකා රජයට සහයෝගය දැක්වීමට ඉන්දියානු රජය දරන ප්‍රයත්නයේ තවත් අවස්ථාවක් ලෙස මෙම ව්‍යාපෘතිය සැලකිය හැකිය. ශ්‍රී ලංකාව තුළ සංවර්ධන සහයෝගීතා ව්‍යාපෘතීන් සඳහා ඉන්දියාව ඇමරිකානු ඩොලර් බිලියන 3 ක් පමණ ලබා දී ඇති අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 560 ක්ම නැවත නොගෙවිය යුතු ප්‍රදාන වේ.

කොළඹ

2019 ජනවාරි 22